(පහත දැක්වෙනුයේ HNB ඇෂුවරන්ස් පොදු සමාගමේ 2018 සංකලිත වාර්ෂික වාර්තාවේ පිටු අංක 26 - 29 හි සදහන් සභාපතිතුමියගේ විවරණයේ සිංහල පරිවර්තනයක් පමණි.)

## සභාපතිතුමියගේ පණිවිඩය

### රන් අකුරින් සටහන් වූ පරිණාමය (Evolution Etched in Gold)

HNB ඇෂුවරන්ස් පොදු සමාගම සියළුම ව්‍යාපාර ක්ෂේත්‍රයන්හි වර්ධනීය කාර්ය සාධනයක් අත්පත්කරගනිමින් කර්මාන්තයේ වර්ධන වේගය හා සමගාමී වර්ධනයක් වාර්තා කිරීමට සමත් වී තිබේ. සමාගම විසින් ළඟා කරගත් විචක්ෂණ වර්ධනයත්, සාම්ප්‍රදායික අවදානම් ආකෘතියක් සමග බැලූවිට මෙය සැළකිය යුතු තත්ත්වයකි.

අපගේ 17 වැනි වාර්ෂික මහ සභා රැස්වීමට ඔබ සියළු දෙනාම සාදරයෙන් පිළිගන්නා අතර 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන අපගේ සත්වැනි සංකලිත වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය වාර්තා මම ඔබට ඉදිරිපත් කරමි.

පසුගිය වර්ෂයන් මෙන්ම 2018 වර්ෂය සලකා බැලීමේදී ද HNB ඇෂුවරන්ස් පොදු සමාගමේ හි මූලික ලක්ෂණය ලෙස එහි කාර්ය සාධනයේ ස්ථාවර බව සහ අඛණ්ඩ වර්ධනය දැක්විය හැකිය. සාර්ව ආර්ථික අභියෝග රැසක් හමුවේ සිදුවන අපගේ ‘පරිණාමය’, 2017 වසර සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළ අප සමාගම පිරිවැටුමේ 12% ක වර්ධනයක් අත්පත් කර ගැනීමෙනුත් ලාභදායිත්වයේ ආකර්ශණීය 197% ක වර්ධනයක් අත්පත් කර ගැනීමෙනුත් පැහැදිළි වේ.

### අභියෝගාත්මක අවධිය (Challenging Times)

### ගෝලීය ආර්ථිකය (Global Economy)

සංවර්ධිත සහ ඉදිරියට පැමිණෙමින් තිබෙන වෙළෙඳපොළවල් ගත්විට ගෝලීය වශයෙන් ආර්ථික කටයුතු වල මන්දගාමී වීමක් සිදුවිය. එක්සත් ජනපදය සහ චීනය අතර වූ වෙළෙඳ යුද්ධයෙන් බලගන්වනු ලැබූ ෆෙඩරල් අනුපාතයේ පැහැදිලි වැඩිවීම ගෝලීය වෙළෙඳ මෙහෙයුම් මත සෘණාත්මක බලපෑමක් දැක්වීය. සියළු කොටස් මිල දර්ශකය (ASPI) 2018 වසර අවසානයේදී සෘණාත්මක තත්ත්වයකින් අවසන් වූ අතර, කළාපීය පසුබිම සළකා බැලීමේදී අනෙකුත් කළාපීය දර්ශකද වඩා වැඩි පහළ බැසීමක් වාර්තා කර තිබේ. කාර්ය සාධනය ගත් විට සමස්ථයක් ලෙස ඉදිරියෙන් තිබෙන සහ ඉදිරියට පැමිණමින් තිබෙන වෙළෙඳපොලවල්, 2018 ඉහළ ආදායමක් වාර්තා කළ එක්සත් ජනපදය සමඟ සැසඳීමේදී අඩු කාර්ය සාධනයක් වාර්තා කර තිබේ.

ආසියා පැසිෆික් කළාපයේ ආර්ථික වර්ධනය, එහි වේගයෙන් වර්ධනය වන මධ්‍යම පන්තිය තුළින් මතුවනුයේ වැඩිවෙමින් පවතින වැයකල හැකි ආදායම් නිසා රක්ෂණය කිරීමේ අවශ්‍යතාවද ඇතුළත්ව පාරිභෝගිකයන්ගේ හැසිරීම් වල වේගවත් වෙනස් වීම් මගිනි. ශ්‍රී ලංකාවේ තත්ත්වය ද බොහෝ අංශ වලින් ආසියා පැසිපික් කළාපයේ සමගාමීන්ට අනුරූප වන අතර වෙනස්වන ගනුදෙනුකාර අවශ්‍යතාවලට ගැලපෙන ආකාරයට කටයුතු කිරීමට අප තුළ ඇති හැකියාව පිළිබඳ අපි සෑහීමකට පත්වෙමු.

## ශ්‍රී ලංකා ආර්ථිකය (Sri Lankan Economy)

ශ්‍රී ලංකා ආර්ථිකය වසර තුළ අපේක්ෂිත වර්ධනය වූ 3.3% ට වඩා අඩු වර්ධනයක් වාර්තා කර තිබේ. මහ බැංකුවේ දැඩි මූල්‍ය ප්‍රතිපත්තින් නිසා මූලික උද්ධමනය (Core Inflation) පාලනය වූ තත්ත්වයක පැවතිය ද මතුපිට උද්ධමනය (Headline Inflation) ඉහළ අගයක් ගන්නා ලදී. එක්සත් ජනපද ආර්ථිකය ශක්තිමත් වීම තුළ වර්ෂය මැදපොළී අනුපාතිකය ඉහළ අගයක් ගන්නා ලදී. වසර තුළ එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අව ප්‍රමාණය වීම 16.13% ක් වූ අතර වැඩිදියුණු කරන ලද මූල්‍ය ප්‍රතිපත්ති රාමුව තුළ මහ බැංකුවට නම්‍යශීලී විනිමය හුවමාරු අනුපාතයක් පවත්වා ගැනීමට හැකිවිය. පැවතුණු දේශපාලන අර්බුධය සහ සාපේක්ෂ වශයෙන් දුර්වල ආයතනික ඉපයීම්, ප්‍රාග්ධන වෙළෙඳපොළේ කාර්යයසාධනය වෙත සෘණාත්මක බලපෑමක් එල්ල කරන ලදී. වෙළෙඳපොල ප්‍රාග්ධනීකරණයේ සමස්ථ පහළ බැසීමට අනුකූලව සියළු කොටස් මිල දර්ශකය (ASPI) 4.98% කින් 6,052.37 දක්වා පහත ගිය අතර S&P SL20 දර්ශකය 14.61% කින් 3,135.18 දක්වාද පහත වැටුණි. ප්‍රතිපත්තිමය අස්ථිරතාවන්, ප්‍රතිපත්ති ක්‍රියාත්මක නොකිරීම සහ ඵලදායිතාව නොමැති වීම නිසා රු. මිලියන 22,789 ක් වූ උප ප්‍රාමාණික ශුද්ධ විදේශ (Substandard Net Foreign Outflow) ගලා යාම, අඩු ආයෝජක සංවේදීතාවක් නිර්මාණය කරන ලදී.

වසර තුළ ආනයන වියදම වැඩිවීමත් ශ්‍රී ලංකාවේ වෙළෙඳ ගිණුම් හිඟය (Deficit) පුළුල් වීමත් හේතුවෙන් අපනයන ඉපයීම් වැඩිදියුණු වීමෙන් ඇතිවූ ධනාත්මක බලපෑම යටපත් විය. මධ්‍ය කාලීනව රාජ්‍ය මූල්‍ය වඩා ශක්තිමත් වීම අපේක්ෂා කරන අතර එමගින් අනාගතයේ සාර්ව ආර්ථික ස්ථාවර භාවයක් අපට අපේක්ෂා කළ හැකිය.

2019 වර්ෂය තුළ දළ දේශීය නිෂ්පාදිතය (Gross Domestic Product – GDP) 4.3% - 4.5% ක් අතර ප්‍රමාණයකින් වර්ධනය වීම අපේක්ෂා කෙරේ. සමස්ථයක් වශයෙන් ශ්‍රී ලාංකීය ආර්ථිකයේ මධ්‍ය කාලීන අපේක්ෂාවන් සම්බන්ධයෙන් අපි ධනාත්මක ආකල්පයක සිටිමු.

මෙම අභියෝගාත්මක දේශීය සහ ගෝලීය පසුබිම තුළ අපගේ කැපවුණ කණ්ඩායම් සහභාගිත්වය සහිතව වෙනස්වන පරිසරයට ගැලපෙන ලෙස නව ක්‍රමෝපායන් උකහා ගනිමින් ව්‍යාපාර ක්ෂේත්‍රයේ නව පැතිකඩ ගවේෂණය කරමින් අපි ඉදිරියට ගමන් කළෙමු.

## රක්ෂණ කර්මාන්තය (The Insurance Industry)

වර්ධනය වන තරඟකාරි වෙළෙඳපොල බෙදාගන්නා දේශීය රක්ෂණ කර්මාන්තයේ පවතින සමාගම් වලට යහපත් තත්ත්වයක් පෙන්නුම් කරන අතර මෙම විභවය තවම සම්පූර්ණයෙන් ගණනය කර නැති නමුත් රක්ෂණ ක්ෂේත්‍රයේ ශක්තිමත් ආයෝජන අවස්ථා දක්නට ලැබේ. මෙම අවස්ථා කුමක් වුවත් දළ දේශීය නිෂ්පාදතයේ ප්‍රතිශතයක් වශයෙන් රක්ෂණ වාරික (Insurance Penetration) ගත්විට එහි ඇති පහත් මට්ටම නිසා වර්ධනය සීමා වී තිබේ. වර්තමාන ජාතික සංඛ්‍යාලේඛන දක්වන ආකාරයට දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව රක්ෂණ වාරික වටිනාකම (Insurance Penetration) තවමත් දළ දේශීය නිෂ්පාදිතයෙන් (Gross Domestic Product - GDP) 1.2% ක මට්ටමක පවතින අතර ගෝලීය සමාන්‍ය අගය 3%කට වඩා ඉහළයාම මගින් පෙන්නුම් කරන්නේ කුටුම්භ සහ වෙළෙඳ ආයතන බොහොමයකට අනපේක්ෂිත හානි වලට මුහුණ දීමේදී දැඩි මූල්‍ය අවදානම් දැරීමට සිදුවන බවයි.

එකම මිල ගණනක් සඳහා තරඟකරන තරඟකරුවන් කිහිප දෙනෙකුගෙන් වෙළෙඳපොල තදබද වී ඇති අතර වර්ධනයන් ළඟා කර ගැනීමේ ප්‍රධාන මෙවලමක් ලෙස මිලකරණය භාවිතා කර තිබේ. රක්ෂණ අතිරික්ත සැපයුම මිල ගණන් පහළ දැමීමේ ප්‍රවනතාවයකට හේතුවී ඇති අතර එමගින් ලාභාදායීත්වය තීව්‍ර ලෙස අඩුකිරීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. මෙමගින් සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයට විශේෂයෙන් බලපෑම් එල්ල වී ඇති අතර අපේක්ෂිත ලාභාදායී මට්ටම් වලට බාධා එල්ල වී තිබේ.

ඉහත සඳහන් කරන ලද වර්ෂය තුළ ජීවිත රක්ෂණය සමස්ථයක් වශයෙන් ගත්කළ වර්ධන අනුපාතයේ පහත වැටීමක් පෙන්වා තිබේ. ජීවන වියදම වැඩිවීම, අඛන්ඩ ගෙවීම් සිදුකිරීම ඇති හැකියාවට බාධාවක් වීම සහ කාළගුණික සම්බන්ධ බාධාවන්ද මෙම තත්ත්වයට බලපා තිබේ.

සාමාන්‍ය රක්ෂණ කර්මාන්තයේ වර්තමාන පසුබිම තුළ තරගකාරිත්වය විසින් සාමාන්‍ය රක්ෂණ කර්මාන්තය මූලික වශයෙන් රථවාහන රක්ෂණ ක්ෂේත්‍රය කෙරෙහි විතැන් කරමින් සාමාන්‍ය රක්ෂණ කර්මාන්තයේ නිෂ්පාදන කළඹින් 60%කට වඩා මෝටර් රථ රක්ෂණ වාරික මගින් ලැබී ඇත. වේගයෙන් වර්ධනය වන නව වාහන ලියාපදිංචි කිරීම් සංඛ්‍යාවත් මෝටර් වාහන රක්ෂණය කිරිම අනිවාර්යය වීමත් නිසා සාමාන්‍ය රක්ෂණ සමාගම් වර්ධනය වැඩිකිරීම සඳහා මෝටර් රථ රක්ෂණය කෙරෙහි වැඩි අවධානයක් යොමු යොමු කර තිබේ.

2018 වසර අවසාන වන විට සමස්ථ රක්ෂණ සමාගම් සංඛ්‍යාව 24 ක් වූ අතර සංයුක්ත සමාගම් 2 ද ජීවිත රක්ෂණ සමාගම් 12 ද සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ සමාගම් 10 ක් ද එයට ඇතුළත් වේ. කර්මාන්තය ශක්තිමත් කිරීම කෙරෙහි යොමුවූ නියාමන වෙනස්කම් නිසා මෙම වසර විශේෂ වේ. වෙන් කිරීමේ නියාමනයන් හඳුන්වාදුන් අවස්ථාවේ සිට කර්මාන්තය තුළ සැළකියු යුතු අත්පත්කරගැනීම් සහ ඒකාබද්ධ කිරීම් කිහිපයක් දක්නට ලැබුණි. තවදුරටත් ඒකාබද්ධ කිරීමේ සංඥාවන් සහ විශාල තරඟකරුවන් තුළ අත්පත්කර ගැනීමට සහ මිලට ගැනීමට ඇති අවශ්‍යතාවන් සහිතව විශේෂයෙන්ම සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රය 2018 වසර තුළ ඉදිරියට යාම සිදුවිය.

### නියාමන ප්‍රතිසංස්කරණ (Regulatory Reforms)

රක්ෂණ ක්ෂේත්‍රයට අදාළව මූල්‍ය වාර්තාකරණයේ ප්‍රතිසංස්කරණ යනු නොවෙනස්වූ ක්ෂේත්‍රයකි. එවන් එක් ප්‍රධාන වෙනස්කමක් වන්නේ 2018 වසරේදී ක්‍රියාත්මක වූ මූල්‍ය උපකරණ (Financial Insturments) සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 9 (SLFRS 9) යොදා ගැනීමේ අවශ්‍යතාවයි. කෙසේ වෙතත් මෙම රෙගුලාසි වලට අනුගත වීම සඳහා රක්ෂකයන්ට 2022 වර්ෂය වන තෙක් අවස්ථාව ලබා දී ඇති අතර එහි තවත් කරුණක් වන්නේ ගෝලීය වශයෙන් සියළුම රක්ෂකයන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 17 (IFRS 17) - රක්ෂණ ගිවිසුම් වලට අනුගත වීම අවශ්‍යවීමයි. රක්ෂකයන්ගේ මූල්‍ය වාර්තාකරණයේ පෙනුමෙහි සැළකිය යුතු වෙනසක් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 17 මගින් ඇති කරයි. ඊට අමතරව 2018 අප්‍රේල් මස සිට ක්‍රියාත්මක වන නව බදු ක්‍රමය යටතේ රක්ෂණ කර්මාන්තය මත බදු අයකරන ක්ෂේත්‍රය තුළ සැළකියයුතු වෙනස් කම් කිහිපයක් හඳුන්වා දී තිබේ. ඒ අනුව ජීවිත රක්ෂණ ව්‍යාපාරය 28% ක බද්දක් ගෙවිය යුතු අතර සහභාගිත්ව රක්ෂණ හිමිකම් තිබෙන ජීවිත රකෂණ හිමිකරුවන්ට (Participating Insurance Policyholders) බෙදා දෙන අතිරික්තය ට 14% ක බද්දක් අය කෙරේ. රක්ෂණ හිමිකරුවන් මත පනවා ඇති බද්ද නිසා බැංකු මගින් ලබා දෙන ඉතිරිකිරීම් සමඟ සන්සන්දනය කිරීමේදී ජීවිත රක්ෂණ ප්‍රතිලාභ තරඟකාරී නොවීම මත ජීවිත රක්ෂණ අංශය කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කරයි.

## සමූහයේ අති විශිෂ්ට කාර්යය සාධනය (Stellar Performance of the Group)

HNB ඇෂුවරන්ස් වසර තුළ විශේෂිත ජයග්‍රහණයක් වාර්තා කළ අතර වඩාත්ම සැළකිය යුතු කාරණය වන්නේ අපගේ කොටස් කාර්යය සාධනය මාස 12 ක කාළ සීමාවක් තුළ රු. 72.50 සිට සිට රු. 132.00 දක්වා ප්‍රශංසනීය ලෙස 82% කින් වර්ධනය වීමත් එය වෙළෙඳපොළ සහ බැංකු මූල්‍ය සහ රක්ෂණ දර්ශකයෙහි (Bank Finance and Insurance Index - BFI Index) වර්ධනය අභිබවායාම සනිටුහන් වීමත්ය. මෙය අපගේ කොටස්හිමියන් වෙනුවෙන් ඇතිකරන අතිවිශාල වටිනාකම පිළිබඳ ශක්තිමත් ඇඟවීමකි. අපගේ වෙළෙඳපොල ප්‍රාග්ධනීකරණය රු. බිලියන 6.6 ක් දක්වා වර්ධනය වි ඇති අතර එය 2017 දී පැවති රු. බිලියන 3.6 දෙගුණයක් වීමක් ලෙස දැක්විය හැකිය.

HNB ඇෂුවරන්ස් සමූහය 2017 දී වාර්තා කළ රු. බිලියන 7.8 ට සාපේක්ෂව 12% ක වර්ධනයක් සමගින් දළ ලේඛනගත වාරිකය (Consolidated GWP) රු. බිලියන 8.7 ක් වාර්තා කර ඇති බව මා ප්‍රකාශ කරන්නේ ඉමහත් සතුටිනි. එසේම HNB ඇෂුවරන්ස් අඛණ්ඩව ලාභදයිත්වය වසරින් වසර වර්ධනය කර ගෙන තිබේ. 2017 වසරේ රු.මිලියන 909.8 ක් වූ බදු පසු ලාභය 2018 වසරේදී රු. බිලියන 2.7 ක් දක්වා 197% කින් වර්ධනය වී ඇත. කෙසේ වෙතත් සැළකිය යුතු කාරණයක් වන්නේ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (Insurance Regulatory Commission of Sri Lanka – IRCSL) නියාමනය හා අනුමැතිය සහිතව එක් වරක් පමණක් තිබිය හැකි අතිරික්තයක් (One-Off Surplus) වන රු. මිලියන 381 හි බලපෑමත් පෙර වර්ෂවල බදු අලාභ ලෙස හඳුනාගත් රු. බිලියන 1.2 ක විලම්බිත බදු වත්කමෙ හි බලපෑමත් මෙයට ඇතුළත් වන බවයි. 2018 දෙසැම්බර් 31 දින වන විට අපගේ වත්කම් වල මුළු වටිනාකම රු. බිලියන 22 ඉක්මවන අතර එයින් රු. බිලියන 17.6 ක් මූල්‍ය ආයෝජන වලින් සමන්විතවීම අපගේ මූල්‍ය ස්ථාවරභාවය පෙන්නුම් කරයි .

සමූහයේ වැඩිදියුණු වූ කාර්යය සාධනය හා සමගාමීව 14% වර්ධනයක්ද සමගින් ආකර්ශනීය අවසන් ලාභාංශය ලෙස කොටසකට රු.7 ක ලාභාංශයක් ප්‍රකාශයට පත් කර ඇත. සමස්ථ ලාභාංශ ගෙවීම් රු. මිලියන 350 ක් වීමත් සමග කොටස් හිමියන්ගේ මුළු ප්‍රතිලාභය (Total Shareholder Return) වසර අවසානයේදී 92% ක වර්ධනයක් විය. 2017 වසරේ රු. 18.20 වූ කොටසක ඉපයුමට සාපේක්ෂව 2018 වසරේදී කොටසක ඉපයුම රු. 54.11 කි. (එය 197% ක වර්ධනයකි). HNBA සමූහයේ ප්‍රාග්ධනය මත ඉපයීම් (Return on Equity – ROE) පසුගිය වසරේ වාර්තා වූ 24% ට සාපේක්ෂව 2018 වසරේ 57% දක්වා වර්ධනය වී ඇත. එක්වරක් පමණක් තිබිය හැකි අතිරික්තය මෙන්ම සමාලෝචිත වර්ෂය තුළ වාර්තාකරන ලද විලම්භිත බදු බලපෑම ද ප්‍රාග්ධනය මත ඉපයීම් හි අන්තර්ගත වී ඇත.

## පරිණාමයේ ක්‍රමෝපාය (Strategy in Evolution)

සමස්ථ රක්ෂණ වෙළෙඳපොලේ පුළුල් අංශයක් වෙත අපගේ පුළුල් අපේක්ෂාවන් දැල්වීම සඳහා 2018 වසරේදී අප සමාගම ව්‍යාපාර දෙකෙහිම පවත්වාගන යන 250 කට වැඩි අලෙවි මාර්ග හරහා ක්‍රියාත්මක කරන ලද බෙදා හැරීම් හැකියාවන් තුළින් අපගේ සමාගමේ ශක්තින් උත්පාදනය කිරීමෙන් අප සමාගම පැහැදිළි අරමුණක් සහිතව ක්‍රමෝපායිකව මෙහෙයවීම සඳහා අපි දිගු පිම්මක් පැන තිබේ. අපගේ පරිණාමනයට දායක වූ තීරණාත්මක ජයග්‍රහණ සාධකයක් වන්නේ නිවැරදි මාර්ගය සහ නිෂ්පාදනයන් මත වූ අපගේ ජයග්‍රාහී වේගය සහ සමාගමේ අවදානම්

දරාගැනීමේ රාමුව තුළ තිබෙන ක්ෂේත්‍රවල අවශ්‍යතා පිරිමැසීම සඳහා කටයුතු කිරීමයි. තවද සැලකියයුතු කළමනාකරිත්වය යටතේ පවතින අරමුදල්වල අගයත් විචක්ෂණශීලී ආයෝජන ක්‍රමෝපායනුත් නිසා සැළකිය යුතු ලාභයක් වාර්තා කර තිබේ.

### නොබැඳුණු ශක්තීන් (Strengths Unbound)

මතුවී තිබුණ ආර්ථික අභියෝග හමුවේ අප සතු වටිනාම වත්කම වන සහස්‍රවාර්ෂිකයන් (millennials) බහුතරයකගෙන් සමන්විත වන HNBA සහ HNBGI කණ්ඩායම් අධ්‍යක්ෂ මණ්ඩලයන්හි සමීප අධීක්ෂණය යටතේ දැඩි කැපවීමකින් යුතුව කටයුතු කළ අතර එමගින් සමාගමේ සමස්ථ වර්ධනයට දැඩි දායකත්වයක් ලබා දෙන ලදී. ඔවුන් නොපැකිල ලබා දුන් සහාය සහ දායකත්වය ඉතා ඉහළින් අගය කිරීමට කැමැත්තෙමි. කෙසේවෙතත් ආර්ථිකයේ විවිධ අංශ තුළ අත්දකින ලද සාමාන්‍ය ආර්ථික පිරිහීම නිසා නව අවස්ථා ගවේෂණය කිරීමට ඇති හැකියාව සැළකිය යුතු ලෙස සීමා වී තිබුණි.

### ආයතනික යහපාලනය (Corporate Governance)

අපගේ ආයතනික අතිවිශිෂ්ටත්වයට මූලික වන්නේ අපගේ ශක්තිමත් ආයතනික යහපාලන රාමුවයි. මනා වූ අවදානම් තක්සේරු සහ කළමණාකරණ ක්‍රමෝපායන් සහිතව වසර පුරා නියාමන අවශ්‍යතාවට වඩා ඉහළ අගයකින් ගන්නා ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය (Capital Adequecy Ratio – CAR) පවත්වාගනිමින් අවදානම් පදනම් වූ ප්‍රාග්ධන නියාමන ක්‍රමය (Risk Based Capital - RBC) වෙත සාර්ථකව හැඩගැසීමට සහාය ලබා දුන්නේ අපගේ එම ශක්තිමත් ආයතනික යහපාලන රාමුවයි.

මෙම වාර්ෂික වාර්තාවෙහි ක්‍රියාත්මක කරන ලද යහපාලන ව්‍යවහාරයන් සම්බන්ධයෙන් විස්තීරණ වාර්තාවක් ඉදිරිපත් කර තිබේ. රක්ෂකයන් සඳහා ආයතනික යහපාලන රාමුව (Corporate Governance Framework) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (Insurance Regulatory Commission of Sri Lanka – IRCSL) විසින් 2018 අග භාගයේදී නිකුත් කර තිබෙන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ සංගමය (CA Sri Lanka) විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය සම්බන්ධයෙන් වන යහ පුරුදු මාලාව 2017 වසරේදී සංශෝධනය කරන ලදී. අප සමාගම හැකි සෑම අවස්ථාවලදීම අප ආයතනික යහපාලන ව්‍යවහාරයන් මෙම සංශෝධිත උපදෙස් මාලාවට අනුකූලව කටයුතුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.

### ලබාගත් ජයග්‍රහණ (Awards Secured)

HNB ඇෂුවරන්ස් සමාගම තම විවිධ වූ පාර්ශ්වකරුවන්ට කරන ලද සේවය වෙනුවෙන් දේශීය මෙන්ම විදේශීය සම්මාන රාශියක් දිනාගෙන තිබේ. 2017 වර්ෂයේ සංකලිත වාර්ෂික වාර්තාවට ශ්‍රීලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ සංගමය විසින් සංවිධානය කරන ලද 54 වැනි වාර්ෂික වාර්තා සම්මාන ප්‍රදානෝත්සවයේදී රක්ෂණ සමාගම් කාණ්ඩයේ රන් සම්මානය අප සමාගමට හිමි විය. 2017 වර්ෂයේදී ශ්‍රී ලංකා ඉස්ලාමීය බැංකු සහ මූල්‍ය කර්මාන්ත සම්මාන උළෙලේදී HNBGI සමාගමෙහි තකාෆුල් රක්ෂණ අංශයට 'Takaful entity of the Year' රිදී සම්මානය පිරිනැමුනි.

## ඉදිරි දර්ශනය (Future Outlook)

අපගේ චිරස්ථායි දැක්ම වන්නේ කර්මාන්තයේ සහ ජාතියේ සංවර්ධනය සඳහා උත්ප්‍රේරකයක් ලෙස කටයුතු කිරීමයි. අපගේ නවෝත්පාදනයන් සහ කර්මාන්තය තුළ පළමුවෙන්ම හඳුන්වාදෙන දේ තුළින් කර්මාන්තය දැනටමත් පුළුල් වීමකට ලක්වී තිබේ. අවශ්‍ය කරන ප්‍රතිපත්ති නිසි පරිදි යොදා තිබීම තුළ ජාතික ආර්ථිකයට ඉදිරිටය යාමේ ඇති හැකියාව වෙත අපි දැඩි විශ්වාසය තබා ඇත්තෙමු. අපගේ පරිණාමය සඳහා වන ගවේෂණය තුළ රක්ෂණ ක්ෂේත්‍රයේ ස්වාභාවය වෙනස් කරන සහ රටේ සහ ජනතාවගේ ජීවිත පෝෂණය කරන, තාක්ෂණය මත පදනම් වූ නිෂ්පාදන සහ විසඳුම් වෙනුවෙන් දැඩි ලෙස ආයෝජනය කිරීමට අපි කැපවී සිටිමු. එළඹෙන වකවානුව තුළ HNB ඇෂුවරන්ස් ඓන්ද්‍රීය සහ ඓන්ද්‍රීය නොවන වර්ධන අවස්ථා වෙත තම අපේක්ෂාවන් යොමු කරන අතර විශේෂිත අංශයක් මගින් යොමුකරන ලද වෙළෙඳපොල මූලාරම්භයන් 2019 වර්ධනය සහ ලාභදායිත්වය ළඟාකරගැනීම සඳහා පැහැදිළි දර්ශනයක් සපයනු ඇත.

## නව පත් කිරීම් (New Appointments)

HNB ඇෂුවරන්ස් PLC සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයන් සඳහා කරන ලද නව පත්කිරීම් හතරක් වාර්තා කිරීමට මම කැමැත්තෙමි. ඩේමියන් ප්‍රනාන්දු මහතා HNBA සහ HNBGI හි ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වශයෙන් පත් කෙරුණ අතර ස්ටුවර්ට් චැප්මන් මහතා ස්වාධීන නොවන සහ විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වශයෙන් HNBA හි අධ්‍යක්ෂ මණ්ඩලයට 2019 පෙබරවාරි 11 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කර තිබේ. ඊට අමතරව සංජය විජේමාන්න මහතා සහ අර්ජුන අබේගුණසේකර මහතා HNBGI හි අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වාධීන නොවන සහ විධායක නොවන අධ්‍යක්ෂවරු ලෙස 2019 පෙබරවාරි 11 වන දා සිට ක්‍රියාත්මක වන පරිදි පත් කර තිබේ. 2019 පෙබරවාරි 11 දින කරන ලද මෙම පත්කිරීම් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ය.

## සේවයෙන් ඉවත් වීම් (Resignations)

මෙම වර්ෂය තුළදී අපගේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු සිය තනතුරුවලින් ඉවත් වුහ. විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වසර දහයක් සේවය කළ සරත් රත්වත්ත මහතා 2019 පෙබරවාරි 06 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්විය. විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වූ රජීව් දිසානායක මහතා HNB ඇෂුවරන්ස් පොදු සමාගමේ (HNBA) සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමේ (HNBGI) අධ්‍යක්ෂ මණ්ඩල වලින් 2019 පෙබරවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්විය. HNB ඇෂුවරන්ස් පොදු සමාගමේ (HNBA) සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමේ (HNBGI) අධ්‍යක්ෂ මණ්ඩලයන් වෙනුවෙන් අප සමූහයේ වර්ධනයට ඔවුන් ලබා දුන් වටිනා දායකත්වය පිළිබඳ මගේ අවංක ඇගයීම මේ අවස්ථාවේ පුද කිරිමට කැමැත්තෙමි.

## ස්තූතිය (Appreciation)

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සභාපති, අධ්‍යක්ෂ ජෙනරාල් සහ අනෙකුත් නිලධාරීන් ලබා දුන් සහාය වෙනුවෙන් අප සමාගම වෙනුවෙන් මම ස්තූතිය පුද කිරීමට කැමැත්තෙමි. එසේම 2018 වසර තුළ රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා විසින් අප වෙත ලබා දෙන ලද සහාය සහ කර්මාන්තය වෙනුවෙන් ඔහුගේ කැපවීම ද ස්තූති පූර්වකව සිහිපත් කරමි.

එසේම මා සමඟ අඛණ්ඩව රැඳී සිටීමින් ලබා දුන් සහාය සහ වටිනා දායකත්වය වෙනුවෙන් HNB ඇෂුවරන්ස් පොදු සමාගමේ (HNBA) සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමේ (HNBGI) අධ්‍යක්ෂ මණ්ඩලයන්හි සැම සාමාජිකයෙකුටම ස්තූතිය පළ කරමි. එසේම අපගේ කළමනාකරණ අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරි දීප්ති ලොකුආරච්චි මහතාට සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය තුළ සිටින සියළු නිලධාරීන්ටත් විධායක කමිටුවේ සාමාජිකයන්ටත් අප සමූහයේ සාර්ථකත්වය වෙනුවෙන් වූ ඉටුකළාවූ භාරදූර කාර්යභාරය සහ නොසැළෙන කැපවීම වෙනුවෙන් මාගේ ස්තූතිය පුද කරමි.

HNBA සහ HNBGI හි සියලු කාර්ය මණ්ඩල සාමාජිකයින් ඔවුන්ගේ කැපවීම සහ ආචාර ධර්ම හරහා සමූහයේ දියුණුව වර්ධනයට මනා දායකත්වයක් දක්වන ලදී. එම සියළු දෙනාටම එම කැපවීම සම්බන්ධයෙන් මාගේ ස්තූතිය පුද කරමි. එසේම අපගේ කොටස්හිමියන්ට, ව්‍යාපාර හවුල්කරුවන්ට සහ ගනුදෙනුකරුවන්ට ඔවුන් අපගේ හැකියාවන් කෙරෙහි තබන ලද විශ්වාසය වෙනුවෙන් ස්තූති කිරීමට කැමැත්තෙමි. ආයතනයක් වශයෙන් අපගේ අවංකත්වය තහවුරුකරන ආයතනික යහපාලන ප්‍රමිතීන් තවදුරටත් වැඩි දියුණු කරමින් පරිපූර්ණත්වය කරා නොසැලී ස්ථාවරව ඉදිරියටම යන අපගේ වර්ධන ගමන් මග කෙරෙහි ඔබතැබූ විශ්වාසයට අඛණ්ඩව ගෞරවය පුද කරමු.

රෝස් කුරේ,
සභාපතිතුමිය

2019 පෙබරවාරි 11

කොළඹ

*(පහත දැක්වෙනුයේ HNB ඇෂුවරන්ස් පොදු සමාගමේ 2018 සංකලිත වාර්ෂික වාර්තාවේ පිටු අංක 32- 35හි සඳහන් ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ විවරණයේ සිංහල පරිවර්තනයක් පමණි.)*

# ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය

## විප්ලවීය පරිණාමය (A Revolution in Evolution)

සමාලෝචිත වසර තුළ කලාපයම පිඩාවට පත්කරමින් ඇතිවූ ආර්ථික ආරවුල් සහ දේශපාලනික අස්ථාවර බව තුළ වුවද HNB ඇෂුවරන්ස් පොදු සමාගම වෙනස්වන සුළු පරිසර තත්වයෙහි වුවද ස්ථාවරව නැගී සිටින ලදී. රක්ෂණ ක්ෂේත්‍රයේ පළමු සහ ඉදිරිපෙළේ සිටින විශ්වසනීය රක්ෂණ සමාගමක් වශයෙන් අප සමූහයේ සාරධර්ම වලට අනුකූලව කටයුතු කිරීම හේතුවෙන් අපගේ පාරිභෝගිකයන් හට අප කෙරෙන් ආරක්ෂිත රැකවරණයක් ලැබුනි. මෙම වර්ෂයේ වාර්ෂික වාර්තාවේ අනුනාදයක් මෙන් 2018 වසර තුල අපගේ "පරිණාමය" නොයෙක් ආකාරයෙන් දිස්වූයේ ව්‍යාපාරයේ ප්‍රමාණය සහ විෂය පථය පුළුල් කිරීමත්, ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ අංශ දෙකෙහිම ප්‍රධාන භූමිකාව නිරූපණය කරන්නන් බවට පරිවර්තනය වීමත් සමගිනි.

මෙම පසුබිම තුළ 2018 වසරින් අවසන් වන මුදල් වර්ෂය සඳහා HNB ඇෂුවරන්ස් PLC (HNBA) හි හත්වන සංකලිත වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන්නේ හදපිරි සතුටිනි. මෙම වාර්ෂික වාර්තාව තුළ සමාගමේ සහ එහි පූර්ණ පරිපාලිත සමාගමක් වන HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමේ තෙවදැරුම් කාර්යය සාධනය අන්තර්ගතව ඇත.

2018 වසර තුළ අප සමූහයේ සියළු අංශ මගින් ලබාදෙන ලද අතිවිශිෂ්ට කාර්යය සාධනය පිළිබිඹු කරමින් සමූහයක් ලෙස රු. බිලියන 2.7ක ලාභදායි බදු පසු ලාභයක් HNB ඇෂුවරන්ස් පොදු සමාගම (HNBA) සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම (HNBGI) අත්පත්කරගැනීමට සමත් වී ඇත. පසුගිය වර්ෂය සමඟ සන්සන්දනාත්මකව බැලීමේදී මෙය 197% ක වර්ධනයකි. නිෂ්පාදන සහ සේවා කළඹෙහි විවිධත්වය ආරක්ෂා කරගැනීම හා අපගේ අනාගත පරිණාම මාවත එළිකිරීම් අරමුණු කරගත් අපගේ ජයග්‍රාහී උපායමාර්ගයන් ක්‍රියාවටනැංවීම අප සමූහයේ සාර්ථක ප්‍රතිපලවලට හේතුපාදක විය.

## ප්‍රතිවිරුද්ධ ධාරාවන් (The Headwinds)

වාණිජමය දෘෂ්ටිකෝණයකින් බලන විට 2018 වර්ෂය දැඩි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් ව්‍යාපාර, ව්‍යවසායන් සහ පුද්ගලයන්ගේ විශ්වසනීයත්වයට බලපෑමක් ඇතිවූ පීඩනයට ලක්වූ ආර්ථික ක්‍රියාකාරකම් බහුල වර්ෂයක් ලෙස හැඳින්විය හැක.

නව දේශීය ආදායම් පනත යටතේ හඳුන්වා දෙනු ලැබූ 2018 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක කරන ලද බදු ප්‍රතිසංස්කරණ රක්ෂණ ක්ෂේත්‍රයට පුළුල් බලපෑමක් ඇති කරන ලදී. මෙම නව බදුකරණ පරිසර රාමුව තුළ සමාගම ලාභදායි ලෙස ඉදිරියට ගෙනයාම 2018 වර්ෂයේ අවසන් කාර්තු තුන තුළ තිබූ ප්‍රධානම අභියෝගය වූ අතර මෙම ප්‍රවණතාව අනාගතයේදී ද පවතිනු ඇත.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වසර තුළ ලැබෙන අතිරික්තය මත 28% ක බදු ගෙවීමට පවතින සියළුම ජීවිත රක්ෂණ සමාගම් වලට සිදුවී තිබේ.

## සියළු අභියෝග වලට එරෙහිව නැගී සිටීම (Rising Against all Odds)

HNB ඇෂුවරන්ස් පොදු සමාගම (HNBA) යනු විනිවිදභාවය, කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව පිළිබඳ මනා ඉතිහාසයක් සහිත ලැයිස්තුගත සමාගමකි. විචක්ෂණශීලී ආයෝජන තවදුරටත් වැඩිකිරීමටත් විශේෂයෙන් සකස් කරන ලද නිෂ්පාදනයන් සම්බන්ධයෙන් කර්මාන්තයේ ධර්මතා අභිභවා වර්ධනය වීමටත් ඩිජිටල්කරණය කරන ලද පාරිභෝගික සේවාවන් සම්බන්ධයෙනුත් අපහට ප්‍රමාණවත් ධාරිතාවක් පවතී. අපි අපගේ මූලික ආචාරධර්මවලට සත්‍යවාදී වෙමින් සදාචාරාත්මක සහ ස්ථාවර රක්ෂණ සේවාවන් සැපයීම පිළිබඳව අපගේ සම්පූර්ණ අවධානය යොමු කරමු. අපගේ නිෂ්පාදන මනා තත්ත්වයෙන් යුතුවීම හා ඉතා සරලවීම තුලින් පාරිභෝගිකයන්ට ඉහළ මට්ටමේ විශ්වසනීය බවක් ලබා දෙන අතර ම ඔවුන්ගේ ආරක්ෂණ අවශ්‍යතා හොඳින් ආවරණය කර ඇත.

අප සමාගමට එය සතු වෙළෙඳපොළ පිළිබඳ ඇති සුපරීක්ෂාකාරී ඇසත් තොරතුරු සොයාගැනීමට ඇති උවමනාවත් නිසා අතිසාර්ථකත්වය නැමැති වෙරළාන්තය දක්වා යාත්‍රා කිරීමට හැකි වූ අතර එමගින් අපගේ සියළු පාර්ශ්වකරුවන්ට අතිමහත් වටිනාකමක් ලැබී තිබේ. වසර ගණනාවක් පුරා මෙන්ම පසුගිය වසර තුළද අභියෝගාත්මක කාලරාමුවක් තුළ HNB ඇෂුවරන්ස් සමාගමට ලාභාදායකත්වය සම්බන්ධයෙන් ශක්තිමත් පදනමක් පවත්වාගෙන යාමට හැකි වී තිබේ.

අපගේ සමාගමට සහ අනෙකුත් සියළුම පාර්ශ්වකරුවන්ට හැකි සෑම විටම වටිනාකමක් එක් කිරීම සඳහා සෑම අවස්ථාවක්ම උපයෝගී කරගැනීමට සක්‍රියව කටයුතු කරන අති දක්ෂ කණ්ඩායමක් අප සතුව සිටීම අපගේ වාසනාවකි. රක්ෂණ සමාගමක අනාගත සාර්ථකත්වය, පහසුවෙන් ලබාගතහැකි රක්ෂණ විසඳුම් මත සහ විශ්වසනීයත්වය මත දැඩි ලෙස රඳා පවතින බව අප දැඩිසේ විශ්වාස කරන අතර එමගින් අප ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයේ ස්වරූපය සකස් කිරීමේදී අන් අය අභිභවා ගොස් ඇත.

### කඩඉම් (The Milestones)

සමාලෝචිත වසර තුළ HNB ඇෂුවරන්ස් පොදු සමාගම (HNBA) සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම (HNBGI), සමස්ථ ව්‍යාපාරය තුළ 12% ක අතිවිශිෂ්ට වර්ධනයක් සමගින් ඒකාබද්ධ දළ ලේඛනගත වාරිකය ලෙස (Consolidated GWP) බිලියන 8.7 ක් වාර්තා කිරීම ආඩම්බරයට කරුණකි.

HNB ඇෂුවරන්ස් පොදු සමාගම විසින් 319%ක සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම (HNBGI) විසින් 200% ක ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතයන් (Capital Adequecy Ration - CAR) වාර්තා කරන ලද්දේ ගිවිසුම් සහ වෙනත් වගකීම් සඳහා කළ සියලු වෙන්කිරීම් වලින් අනතුරුවයි.

## ජීවිත ආරක්ෂණය (Life Assurance)

නව මෙන්ම ලාභදායී වෙළෙඳපොළ අංශ හඳුනාගැනීමටත් විශේෂිත විසඳුම් ලබා දීමටත් අපට හැකියාව ලබා දෙමින් ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ පරිණාමය වේගවත් වී තිබේ. විශිෂ්ට අදහස් ජයග්‍රාහී විසඳුම් බවට නොවරදින ලෙසට පරිවර්තනය කිරීමේ අප සමූහයේ වූ විශේෂිත වූ හැකියාව ලෙස නිවැරදිව ක්‍රියාත්මක කිරීම දැක්විය හැකිය.

HNB ඇෂුවරන්ස් පොදු සමාගම (HNBA) රක්ෂණ කර්මාන්තයේ වර්ධන වේගය හා සමගාමීව 12% ක වර්ධනයක් පෙන්වමින් දළ ලේඛනගත වාරිකය (Consolidated GWP) ලෙස රු.බිලියන 4.4 ක් අත්පත්කරගෙන ඇති අතර එමගින් HNB ඇෂුවරන්ස් පොදු සමාගම (HNBA) තවදුරටත් වෙළෙඳපොළෙහි හයවැනි ස්ථානය තුළ රඳවාගැනීමට හැකි වී ඇත.
පසුගිය වසරේ ශුද්ධ ලාභය වන රු. මිලියන 725.7ට වඩා 241%ක වර්ධනයක් සමගින් රු.බිලියන 2.5ක අපගේ ඉහළම ශුද්ධ ලාභයක් වාර්තා කිරීම සමාගමේ සනිටුහන් කල යුතු සන්ධිස්ථානයක් ලෙස ප්‍රකාශ කරන්නේ සතුටිනි.

මෙම බදු පසු ශුද්ධ ලාභය, වාර්තා කිරීමට හැකිවූයේ ව්‍යාපාරයේ සහභාග නොවන රක්ෂණ අරමුදලෙන් (Non – Participating Fund) ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ අතිරික්තය කොටස්හිමියන් වෙත මාරුකිරීම් (Surplus Transfer) රු. මිලියන 381.2 ක් සහ රු. බිලියන 1.17ක් වූ විලම්භිත බදු වත්කම සමගින් බව සඳහන් කිරීම වඩාත් උචිතය. එමෙන්ම ජීවිත ආරක්ෂණ ව්‍යාපාරය 2017 වර්ෂයේදී වාර්තාකරන ලද රු. මිලියන 519 ට සන්සන්දනාත්මකව රු. මිලියන 638 කට ළඟා වෙමින් ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ අතිරික්තය කොටස්හිමියන් වෙත මාරුකිරීම් (Surplus transfer) වල 23% ක වර්ධනයක් වාර්තා කර තිබේ.

මෙම වසර තුළ HNB ඇෂුවරන්ස් පොදු සමාගමෙහි ජීවිත අරමුදල (Life Fund) 12% කින් වර්ධනයක්ද සමගින් රු. බිලියන 12.3 ක සන්ධිස්ථානයක් වාර්තා කර ඇති අතර රක්ෂණ ඔප්පු හිමියන්ට ආකර්ෂණීය ප්‍රසාද දීමනාව ලෙස රු. 1,000 කට රු. 54 ක් ද අරමුදල් පදනම් වූ ප්‍රතිලාභ (Fund based) රක්ෂණ ඔප්පු හිමියන්ට 8.5% ක ලාභාංශ අනුපාතයක්ද ලබා දීමට හැකිවිය.

### සාමාන්‍ය රක්ෂණය (General Insurance)

සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍ර යේ සියළු දෙනාගේම අවධානය දිනාගත් විශේෂිත තත්ත්වයකට පත්වීම දක්වා වූ අපගේ පරිණාමයේ ගමන් මග තුළ පාරිභෝගිකයන්ගේ හිමිකම් පෑම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී තීරණාත්මක කාර්යයක් තාක්ෂණය විසින් ඉටු කරන තත්ත්වය තුළ සියළුම විවිධ කාරකයන් එකට එක් කිරීම සඳහා අපගේ ගතික ප්‍රවේශය හේතුවක් වී තිබේ. සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ ඇති අභියෝග ජයගැනීම සඳහා මනා ලෙස අරමුණු කරගත් පැහැදිළි ක්‍රමෝපායන් 2018 වර්ෂය තුළ අපගේ ප්‍රශංසනීය වර්ධනයට හේතු වී තිබේ. වසර අවසාන වන විට HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම (HNBGI) 11% ක වර්ධනයක් සහිතව රු. බිලියන 4.3 ක දළ ලේඛනගත වාරිකයක් (GWP) සහ රු. මිලියන 230 ක බදු පසු ශුද්ධ ලාභයක් වාර්තා කර තිබේ.

වෙළෙඳපොල උච්චාවචනයන් පිළිබඳ අපගේ තියුණු අවධානය සහ ලාභදායීත්වය සම්බන්ධයෙන් අපගේ වර්ධන ගම්‍යතාව අතිවිශේෂ වර්ධනයක් තහවුරු කර ඇති අතර අප නිෂ්පාදන කළඹ තුල ඉහළ රඳවා ගැනීමක් සහ ලාභදායි බව එමගින් ඇති කර තිබේ. අපගේ විශිෂ්ට වූ දක්ෂතාවන් සමග අපගේ මෙහෙයුම් පරාමිතීන් අලුත් කිරිමටත් අපි නිරන්තරයෙන් උත්සාහ කරන්නෙමු.

### ආයෝජන (Investments)

මෙම වසරේදී වඩා ශක්තිමත් අයෝජන ක්‍රියාවලියක් සමූහය තුළ ස්ථාපිත කරලීමට සමත් වී ඇති අතර අපගේ දූරදර්ශී විනිවිදභාවයෙන් යුත් ඵලදායී අරමුදල් කළමනාකරණ තීරණ සමූහයේ සියළුම පාර්ශ්වකරුවන්ට දිගුකාලීන වටිනාකමක් නොකඩවා ඇතිකරලීමට ඉවහල් වී ඇත.

2018 වසරේදී සමූහයේ ආයෝජන කළඹ මගින් පසුගිය වසරේ ආයෝජන ආදායම අභිබවමින් ආකර්ෂණීය රු. බිලියන 1.97 ක ආයෝජන ආදායමක් වාර්තා කරන ලදී. HNB ඇෂුවරන්ස් පොදු සමාගම විසින් සමූහයේ ආයෝජන ආදායම සඳහා රු. බිලියන 1.6 ක දායකත්වයක් දක්වමින් 11% ක වර්ධනයක් වාර්තා කළ අතර කළමනාකාරිත්වය යටතේ තිබෙන අරමුදල් වල 16%ක වර්ධනය එයට දායකත්වය දක්වා තිබේ. HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම සමූහයේ ආයෝජන ආදායමට රු. මිලියන 327.3 ක් දායක කරමින් පසුගිය වසර සමඟ සැසඳීමේදී 27% ක වර්ධනයක් දක්වා තිබේ.

### ක්‍රමෝපායික විධි අනුගමනය (Driving on Strategic Imperatives)

අප සතුව ශක්තිමත් පාලන ව්‍යුහයක් පවතින අතර අප සමාගම ඓතිහාසිකව තම විෂය පථය සහ රක්ෂණ නිෂ්පාදන සහ විසඳුම් වල සීමාවන් පුළුල් කරගැනීම සිදුකරන විට අපගේ පාර්ශ්වකරුවන්ගෙන් අප දැඩි ලෙස ප්‍රතිලාභ ලබා

තිබේ. අපගේ කාලීන නවෝත්පාදනයන්ට වෙළෙඳපොලේ සහ සේවකයන්ගේ සහ පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය දිනා ගැනීමට හැකි වී තිබේ.ගෝලීය වශයෙන් ජනතාව සහ කර්මාන්ත වෙනස් වන්නේ කෙසේද යන්න පිළිබඳ මූලික දර්ශකයක් වන තාක්ෂණය යොදාගැනීමේ දී අපි විශේෂත්වයක් ගොඩනගාගෙන සිටිමු. රක්ෂණ කර්මාන්තය ක්‍රමයෙන් කඩා බිඳ දමමින් තාක්ෂණය විසින් අපි රක්ෂණ හිමිකම් නිකුත් කරන ආකාරය වෙනස් කර නව දත්ත විශාල ප්‍රමාණයක් ඇති කිරීමට පහසුකම් සපයා තිබේ.

වසර තුළ වෙනස්වන පාරිභෝගික අවශ්‍යතා සහ වෙළෙඳපොල ගතිකත්වයන් වෙත අවධානය යොමු කරමින් අප ආකර්ශණීය නව නිෂ්පාදන හඳුන්වා දී තිබේ. පිළිකා රක්ෂණය ( 'Hope' ) සහ ඩෙංගු රක්ෂණය ('Safenet') අප විසින් අපගේ නිෂ්පාදන විවිධාංගිකරණය කරමින් අපගේ වටිනා පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා වලට අනුව නිර්මාණය කරන ලද වෙළඳපොලේ ප්‍රථම විප්ලවීය වෙළෙඳ නිෂ්පාදන වේ. එසේම අපි ස්මාර්ට් ෆයිව් ('Smart 5)'නමින් ආකර්ෂණීය ලාභාංශ සහිත ආයෝජන රක්ෂණ සැලසුමක් අපගේ රක්ෂණ හිමිකරුවන්ට හඳුන්වා දී තිබේ. තකාෆුල් වෙළෙඳපොලේ පාරිභෝගික අවශ්‍යතා වලට අනුව අප තවත් විප්ලවීය අස් - සලාම් (As-Salam) මෝටර් රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දී තිබේ.

අපගේ ක්‍රමෝපායික ආයතනික අරමුණු ද අපගේ තිරසාරත්ව මූලාරම්භයන් සමඟ සමීපව බද්ධ වී තිබේ. අවධානය අවශ්‍ය ක්ෂේත්‍රවලට, ප්‍රජාවන්ගෙන් සහ ආයතන වලින් මූල්‍ය සහ යටිතල පහසුකම් අවශ්‍ය ප්‍රජාවන්ට අපි සත්‍ය වශයෙන්ම සහාය ලබා දී ඇත්තෙමු. අපගේ ආයතනික සමාජ වගකීම පිළිබඳ ක්‍රමෝපාය තුළින් අප කරන දේ සහ අප අපේක්ෂා කරන දේ අතර සමබර බවක් පවත්වාගැනීම අපේ අරමුණයි. අරමුණු වෙනුවෙන් කටයුතු කරන, අපගේ ව්‍යාපාරයේ හදවත ලෙස අපගේ පාර්ශ්වකරුවන් තබාගන්නා සංවිධානයක් වශයෙන් අඛණ්ඩව අප කටයුතු කරන අතරතුර කාබන් උදාසීන වැඩ පරිසරයක් සකස් කිරීම වැනි අතිශය වැදගත් පරිසර හිතකාමී මූලාරම්භයන් තුළින් ආරම්භ වූ අපගේ ආයතනික සමාජ වගකීම් ඉටුකිරීමේ උත්සාහයන්හි ප්‍රායෝගික සහ අවාරධර්මීය ස්වාභාවය පාසල් ජල ව්‍යාපෘති වල සිට කාන්තාවන් සහ ප්‍රජාවන් බලගැන්වීම දක්වා දිගුකාලීන ප්‍රතිඵල සහිත දැක්මක් සහිතව ක්‍රියාත්මක වේ.

## කොටස් හිමියන්ගේ වටිනාකම් (Shareholder Value)

කොටස් හිමියන්ගේ වටිනාකම ඉහළ නැංවීමට HNB ඇෂුවරන්ස් සමාගම කළ දැඩි බලපෑම අගය කරමි. 2018 වසර ආරම්භයේදී අප සමාගමේ කොටසක නාමික අගය රු. 72.50 ක් වූ අතර වසර අවසන් වන විට එම අගය දෙගුණ වෙමින් රු.132.00 ක් දක්වා වැඩිවී තිබිණි. කොළඹ කොටස් හුවමාරුවේ කොටස් දර්ශකයන්හි යටිකුරු චලනයක් පෙන්නුම් කරන ලද පසුබිම තුළ කොටස් වටිනාකම දෙගුණ කර ගැනීමට හැකිවීම සමාගම ළඟාකරගත් වැදගත් ජයග්‍රහණ වලින් එකක් ලෙස දැක්විය හැකිය.

## අනාගත දැක්ම (Future Outlook)

රක්ෂණ ක්ෂේත්‍රය කර්මාන්ත එකිනෙකා පරයමින් ඇතිකරගන්නා තරඟය හා තරඟකාරිත්වය තුළින් වැඩිදියුණු වීම අපේක්ෂා කෙරේ. මිල තරඟය ද ප්‍රධාන තරඟකරුවන් අතර තීව්‍ර මට්ටමකට පැමිණ ඇති අතර විවිධත්වයට පත්කරන ලද නිෂ්පාදන සහ පාරිභෝගිකයන් වෙනුවෙන් විශේෂයෙන් සකස් කරන ලද සේවා නිසා වෙළෙඳපොල ද කොටස් වලට බෙදී තිබේ.

2019 මූල්‍ය වර්ෂය දෙස ශුභවාදීව බැලීමේ දී ශ්‍රී ලාංකීය ආර්ථිකය ක්‍රමෝපායිකව ස්ථානගතවීමේ අරගලයක නිරත වන බව අපගේ විශ්වාසයයි. පාරිභෝගිකයන් වෙනුවෙන් ධනාත්මක අත්දැකීමක් නිර්මාණය කරන නව යුගයක් කරා අපගේ පරිවර්තනය වීම සිදුවන කාලය තුල අතිරික්තයන් සහ ඉහළ ප්‍රාග්ධන අවශ්‍යතා සමබර කර ගැනීමට අපි උත්සාහ කරමු. අපගේ දිගු කාලීන ගමන තුළ වඩාත්ම පිහිටක් ලැබිය යුතු ප්‍රජාවන්, පරිසර තත්ත්වයන් සහ ආයතනික ස්ථම්භ සඳහා අපගේ තිරසාර දායකත්වය ලබා දීම පිළිබඳ අපගේ සමෝධානික ඉලක්කය අපි ශක්තිමත් කරමු.

අප සතු ශක්තිමත් වෙළෙඳපොළ දැක්මේ වාසිය ලබා ගනිමින් උපරිම ලාභයක් ලබා ගැනීම සඳහා වන අපගේ නිෂ්පාදන සහ සේවා මාලාව වර්ධනය කිරීම අප විසින් සිදු කරන අතර ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් 17 (IFRS 17) අනුව කටයුතු කරමින් අපගේ සමස්ථ නිෂ්පාදන මිශ්‍රය ප්‍රතිව්‍යුහගත කිරීම අපි අඛණ්ඩව සිදු කරමු.

අපගේ විකාශනය තුළ රක්ෂණ කර්මාන්තයේ වෙනසක් ඇති කරන්නෙකු බවට පත්වීම සඳහා වන අපගේ උත්සාහය තුළ තාක්ෂණය පදනම් කරගත් විසඳුම් අපි තවදුරටත් ශක්තිමත් කරන අතර වියදමින් උපරිම ඵල නෙලා ගැනීමේ කාර්යයයේ දී අපගේ ගනුදෙනුකරුවන්ට “ තම ආරක්ෂාව සඳහා හිමිකම් පෑමේදී’ වඩා පරිපූර්ණ වෙනසක් සහිතව කටයුතු කිරීම සඳහා මූලික වෙනස්කම් සිදු කිරීමට ඩිජිටල්කරණය සහ කොළ රහිත විසඳුම් ලබා දීම කෙරෙහි අප අඛණ්ඩව අවධානය යොමු කරමු. දත්ත විශ්ලේෂණයේදී සහ වෙළෙඳපොළ තොරතුරු වලට අදාළ තොරතුරු තාක්ෂණය තුළ අපි ක්‍රමෝපායික ආයෝජනයක් සිදු කරන අතර ගනුදෙනුකරුවන්ගේ ගතික අවශ්‍යතා වලට වඩාත් යෝග්‍ය වන වඩාත් විප්ලවීය නිෂ්පාදන හඳුන්වා දීම කෙරෙහි අපගේ අවධානය යොමු කරනු ඇත. තාක්ෂණික විසඳුම් මත ආයෝජනය කිරීමෙන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 17 සඳහා අවැසි වෙනස්කම් ඇතිකිරීම සඳහා අපි කටයුතු කරමු.

## ඇගයීම (In Appreciation)

සෑම අවස්ථාවක ම අපවෙත තබන ලද උපරිම විශ්වාසය, පක්ෂපාතීත්වය සහ ප්‍රබෝධමත් දායකත්වය වෙනුවෙන් අපගේ වටිනා ගනුදෙනුකරුවන්ට මම මාගේ අවංක ඇගයීම පුද කරමි. එසේම මෙම සමාගම වෙනුවෙන් තම මග පෙන්වීම සහ සහාය ලබා දුන් සභාපතිතුමිය සහ අධ්‍යක්ෂ මණ්ඩලයත් මාගේ ඇගයීමට පාත්‍ර කළ යුතුය.

එසේම අපගේ රක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රමිතීන් වර්ධනය කිරීමට ගන්නා උත්සාහය වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ රක්ෂණ මණ්ඩලයේ සභාපතිතුමා, අධ්‍යක්ෂ ජෙනරාල්වරයාට සහ කාර්ය මණ්ඩලයටත් ස්තුතිය පුද කරමි.

එසේම මාගේ ස්තුතිය විධායක කමිටුවේ සියළු සාමාජිකයන්ටත් අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ටත් කාර්යය මණ්ඩලයේ සියළු දෙනාටත් ක්ෂේත්‍ර බලකායේ සියළුම සාමාජිකයන්ටත් පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. ඔවුන්ගේ තනි හා සාමූහික ප්‍රයත්නයන් වෙනුවෙන් මාගේ හදපිරි ස්තුතිය පුද කරමි.

අවසන් වශයෙන් අපගේ සියළුම තැරැව්කරුවන්, ප්‍රතිරක්ෂණ කරුවන්, අතරමැදි ජාලයට සහ සියළුම ක්‍රමෝපායික ව්‍යාපාර පාර්ශ්වකරුවන් ලබාදුන් වටිනා දායකත්වය වෙනුවෙන් මාගේ ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි.

දීප්ති ලොකුආරච්චි
කළමනාකරණ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිළධාරි

2019 පෙබරවාරි 11

## HNB ඇෂුවරන්ස් PLC
## මූල්‍ය තත්ව ප්‍රකාශය

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| **දෙසැම්බර් 31 දිනට,** | **2018** | **2017** | **2018** | **2017** |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **වත්කම්** | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 151,559 | 169,620 | 104,487 | 119,078 |
| අස්පෘෂ්‍ය වත්කම් | 61,087 | 57,841 | 58,782 | 57,841 |
| විලම්භිත බදු වත්කම් | 1,304,882 | 64,098 | 1,280,499 | - |
| මූල්‍ය ආයෝජන | 17,579,131 | 15,054,910 | 14,679,706 | 12,741,015 |
| ආයෝජන - පරිපාලිත සමාගම | - | - | 1,150,000 | 1,150,000 |
| ජීවිත රක්ෂණ හිමියන්ට දී ඇති ණය | 243,113 | 162,285 | 243,113 | 162,285 |
| ලැබිය යුතු ප්‍රති රක්ෂණ | 415,773 | 569,778 | 75,926 | 65,010 |
| ලැබිය යුතු රක්ෂණ වාරික | 798,213 | 786,319 | 8,046 | 7,488 |
| වෙනත් වත්කම් | 823,101 | 1,036,846 | 575,154 | 764,256 |
| රක්ෂණ ගිවිසුම් – විලම්භිත වියදම් | 140,486 | 105,287 | - | - |
| මුදල් සහ මුදල් සමානතා | 761,871 | 641,950 | 502,561 | 352,307 |
| **මුළු වත්කම්** | **22,279,216** | **18,648,934** | **18,678,274** | **15,419,280** |
| | | | | |
| **හිමිකරු ප්‍රාග්ධනය සහ වගකීම්** | | | | |
| **මව් සමාගමේ මුළු හිමිකරු ප්‍රාග්ධනය** | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 1,171,875 | 1,171,875 | 1,171,875 | 1,171,875 |
| රඳවාගත් ලාභ | 4,405,581 | 2,381,427 | 4,167,660 | 2,373,601 |
| විකිණීම සඳහා වර්ගීකරණය කරන ලද ආයෝජනයන්හි සංචිත | (8,025) | 30,685 | 1,451 | 17,415 |
| වෙනත් සංචිත | (4,406) | (10,760) | (4,395) | (9,884) |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතය | (201,867) | 223,272 | (201,867) | 223,272 |
| සීමිත නියාමන සංචිතය | 381,156 | - | 381,156 | - |
| **මව් සමාගමේ මුළු හිමිකරු ප්‍රාග්ධනය** | 5,744,314 | 3,796,499 | 5,515,880 | 3,776,279 |
| පාලනයට නතුනොවන අයිතිය | - | - | - | - |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය** | 5,744,314 | 3,796,499 | 5,515,880 | 3,776,279 |
| | | | | |
| **වගකීම්** | | | | |
| රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත රක්ෂණ | 12,261,472 | 10,915,858 | 12,261,472 | 10,915,858 |
| රක්ෂණ ප්‍රතිපාදන - සාමාන්‍ය රක්ෂණ | 2,525,095 | 2,384,906 | - | - |
| සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | 140,356 | 126,083 | 84,840 | 73,875 |
| වර්තමාන බදු වගකීම | 22,541 | 34,598 | 14,708 | - |
| ගෙවිය යුතු ප්‍රති රක්ෂණ | 369,853 | 353,042 | 116,268 | 90,650 |
| වෙනත් වගකීම් | 1,092,809 | 896,288 | 642,470 | 529,862 |
| බැංකු අයිරාව | 122,776 | 141,660 | 42,636 | 32,756 |
| **මුළු වගකීම්** | 16,534,902 | 14,852,435 | 13,162,394 | 11,643,001 |
| | | | | |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය සහ වගකීම්** | **22,279,216** | **18,648,934** | **18,678,274** | **15,419,280** |

ඉහත මූල්‍ය තත්ව ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 218 හී ඇති විගණනය කරන ලද මූල්‍ය තත්ව ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC

## ලාභාලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා, | සමූහය 2018 | සමූහය 2017 | සමාගම 2018 | සමාගම 2017 | වෙනස සමූහය | වෙනස සමාගම |
|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | % | % |
| දළ ලේඛනගත රක්ෂණ වාරික | 8,724,696 | 7,821,468 | 4,420,513 | 3,963,642 | 12 | 12 |
| ප්‍රති රක්ෂකයන්ට කැපකළ වාරික | (1,059,269) | (1,100,573) | (215,630) | (189,093) | (4) | 14 |
| ශුද්ධ ලේඛනගත රක්ෂණ වාරික | 7,665,427 | 6,720,895 | 4,204,883 | 3,774,549 | 14 | 11 |
| නොඉපැයූ රක්ෂණ වාරිකවල සංචිතයේ ශුද්ධ වෙනස | (216,988) | (328,818) | - | - | (34) | - |
| **ඉපැයූ ශුද්ධ රක්ෂණ වාරික** | **7,448,439** | **6,392,077** | **4,204,883** | **3,774,549** | **17** | **11** |
| | | | | | | |
| **වෙනත් ආදායම්** | | | | | | |
| පොලී හා ලාභාංශ ආදායම | 1,887,343 | 1,693,191 | 1,591,900 | 1,442,073 | 11 | 10 |
| උපලබ්ධි වූ ශුද්ධ ලාභ | 74,058 | 33,128 | 68,673 | 28,789 | 124 | 139 |
| ශුද්ධ සාධාරණ අගය මත ලාභය/(අලාභය) | 8,482 | 9,704 | (18,036) | 7,653 | (13) | (336) |
| ගාස්තු සහ කොමිස් ආදායම් | 172,646 | 129,099 | 79,465 | 61,494 | 34 | 29 |
| වෙනත් ආදායම් | 36,030 | 46,735 | 14,627 | 24,958 | (23) | (41) |
| **මුළු වෙනත් ආදායම්** | **2,178,559** | **1,911,857** | **1,736,629** | **1,564,967** | **14** | **11** |
| **ශුද්ධ ආදායම** | **9,626,998** | **8,303,934** | **5,941,512** | **5,339,516** | **16** | **11** |
| | | | | | | |
| **ශුද්ධ ප්‍රතිලාභ, වන්දි සහ වියදම්** | | | | | | |
| ශුද්ධ රක්ෂණ ප්‍රතිලාභ සහ ගෙවූ වන්දි | (3,123,585) | (2,178,556) | (1,035,164) | (563,628) | 43 | 84 |
| ශුද්ධ ගෙවියයුතු රක්ෂණ වන්දිවල වෙනස | (112,904) | (114,850) | (31,410) | (11,923) | (2) | 163 |
| ජීවිත රක්ෂණ සංචිතයේ ගිවිසුම්ගත වගකීම්හී වෙනස | (1,707,149) | (2,166,427) | (1,707,149) | (2,166,427) | (21) | (21) |
| ජීවිත රක්ෂණ සංචිතයේ ගිවිසුම්ගත වගකීම්හී වෙනස - එක් වරක් පමණක් තිබිය හැකි අතිරික්තය | 381,156 | - | 381,156 | - | - | - |
| වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් | (2,282,481) | (1,839,031) | (1,351,799) | (1,018,783) | 24 | 33 |
| ප්‍රාරක්ෂණ සහ ශුද්ධ අත්පත්කරගැනීමේ වියදම් | (1,125,418) | (1,028,872) | (847,968) | (822,715) | 9 | 3 |
| වෙනත් රක්ෂණ අදාළ වියදම් | (75,963) | (49,171) | (51,330) | (30,375) | 54 | 69 |
| **මුළු ප්‍රතිලාභ, වන්දි සහ වියදම්** | (8,046,344) | (7,376,907) | (4,643,664) | (4,613,851) | 9 | 1 |
| | | | | | | |
| **බදු පෙර ලාභය** | 1,580,654 | 927,027 | 1,297,848 | 725,665 | 71 | 79 |
| ආදායම් බදු | 1,124,656 | (17,275) | 1,177,367 | - | 6,610 | - |
| **වර්ෂය සඳහා වූ ලාභය** | **2,705,310** | **909,752** | **2,475,215** | **725,665** | **197** | **241** |
| | | | | | | |
| **වෙනත් විස්තීරණ ආදායම්,(බදු පසු)** | | | | | | |
| **ලාභාලාභ සඳහා නැවත වර්ගීකරණය කරන ලද හෝ වර්ගීකරණය වියහැකි අයිතම** | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | (399,596) | 489,495 | (373,143) | 461,179 | (182) | (181) |
| - ආදායම් ප්‍රකාශයට මාරු කරන ලද උපලබ්ධි වූ ලාභාලාභ | (72,541) | (30,485) | (67,960) | (27,896) | 138 | 144 |
| - ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | 425,139 | (414,403) | 425,139 | (414,403) | 203 | 203 |
| - ආශ්‍රිත බදු | 8,288 | (6,770) | - | - | 222 | - |
| **ලාභාලාභ සඳහා නැවත වර්ගීකරණය නොවන අයිතම** | | | | | | |
| ප්‍රතිමිනුම් මත ලාභ/(අලාභ) - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | 6,354 | (12,550) | 5,489 | (7,998) | 151 | 169 |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම (බදු පසු)** | (32,356) | 25,287 | (10,475) | 10,882 | (228) | (196) |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | 2,672,954 | 935,039 | 2,464,740 | 736,547 | 186 | 235 |
| | | | | | | |
| **මුළු ලාභය :** | | | | | | |
| ව්‍යාපාරයේ හිමිකරුවන්ට ආදළ වර්ෂයේ මුළු ලාභය | 2,705,310 | 909,752 | - | - | 197 | - |
| පාලනයට නතුනොවන අයිතිය | - | - | - | - | - | - |
| **වර්ෂයේ මුළු ලාභය** | 2,705,310 | 909,752 | - | - | 197 | - |
| | | | | | | |
| **මුළු විස්තීරණ ආදායම :** | | | | | | |
| ව්‍යාපාරයේ හිමිකරුවන්ට ආදළ වර්ෂයේ මුළු විස්තීරණ ආදායම | 2,672,954 | 935,039 | - | - | 186 | - |
| පාලනයට නතුනොවන අයිතිය | - | - | - | - | - | - |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | 2,672,954 | 935,039 | - | - | 186 | - |
| | | | | | | |
| **කොටසක ඉපයීම** | | | | | | |
| කොටසක ඉපයීම - මූලික (රු.) | 54.11 | 18.20 | 49.50 | 14.51 | 197 | 241 |
| කොටසක ඉපයීම - මූලික (රු.) එක් වරක් පමණක් තිබිය හැකි අතිරික්තය - රහිතව | 46.48 | 18.20 | 41.88 | 14.51 | 155 | 189 |
| කොටසක ලාභාංශය (රු.) | - | - | 7.00 | 6.00 | - | 17% |

ඉහත ලාභාලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 219 හී විගණනය කරන ලද ලාභාලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමූහය

| 2018 දෙසැම්බර් 31 න් අවසන් වු වර්ෂය සඳහා, | ප්‍රකාශිත ප්‍රාග්ධනය | රඳවාගත් ඉපැයීම් | අලෙවි සංචිත | වෙනත් සංචිත | ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතය | සීමිත නියාමන සංචිතය | මුළු හිමිකම් |
|---|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| **2017 ජනවාරි 01 දිනට ශේෂය** | 1,171,875 | 1,721,675 | (7,152) | 1,790 | (191,131) | - | 2,697,057 |
| වර්ෂයේ මුළු විස්තීරණ ආදායම | | | | | | | |
| **- වර්ෂය සඳහා වු ලාභය** | **-** | **909,752** | **-** | **-** | **-** | **-** | **909,752** |
| **වෙනත් විස්තීරණ ආදායම්,(බදු පසු)** | | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 452,240 | - | - | - | 452,240 |
| - ජීවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා | | | | | | | |
| වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (414,403) | - | - | - | (414,403) |
| - ප්‍රතිමිනුම් මත අලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | - | - | - | (12,550) | - | - | (12,550) |
| වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම | - | - | 37,837 | (12,550) | - | - | 25,287 |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | - | 909,752 | 37,837 | (12,550) | - | - | 935,039 |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා | | | | | | | |
| වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | 414,403 | - | 414,403 |
| **හිමිකරුවන් සමඟ සිදුවු, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | | |
| **- ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | | |
| - 2016 වර්ෂය සඳහා වු ලාභාංශ ගෙවීම් | - | (250,000) | - | - | - | - | (250,000) |
| 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය | **1,171,875** | **2,381,427** | **30,685** | **(10,760)** | **223,272** | **-** | **3,796,499** |
| **2018 ජනවාරි 01 දිනට ශේෂය** | 1,171,875 | 2,381,427 | 30,685 | (10,760) | 223,272 | - | 3,796,499 |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | | | | | | | |
| - වර්ෂය සඳහා වු ලාභය | **-** | **2,324,154** | **-** | **-** | **-** | **381,156** | **2,705,310** |
| **වෙනත් විස්තීරණ ආදායම්,(බදු පසු)** | | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (463,849) | - | - | - | (463,849) |
| - ජීවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා | | | | | | | |
| වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 425,139 | - | - | - | 425,139 |
| - ප්‍රතිමිනුම් මත ලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | - | - | - | 6,354 | - | - | 6,354 |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම** | **-** | **-** | **(38,710)** | **6,354** | **-** | **-** | **(32,356)** |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | **-** | **2,324,154** | **(38,710)** | **6,354** | **-** | **381,156** | **2,672,954** |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා | | | | | | | |
| වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | (425,139) | - | (425,139) |
| **හිමිකරුවන් සමඟ සිදුවු, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | | |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | | |
| 2017 වර්ෂය සඳහා වු ලාභාංශ ගෙවීම් | - | (300,000) | - | - | - | - | (300,000) |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,171,875** | **4,405,581** | **(8,025)** | **(4,406)** | **(201,867)** | **381,156** | **5,744,314** |

ඉහත හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමූහය , වාර්ෂික වාර්තාවේ පිටු අංක 220 හී ඇති විගණනය කරන ලද හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමාගම

| 2018 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා, | ප්‍රකාශිත ප්‍රාග්ධනය | රඳවාගත් ඉපැයීම් | අලෙවි සංචිත | වෙනත් සංචිත | ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතය | සීමිත නියාමන සංචිතය | මුළු හිමිකම් |
|---|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| 2017 ජනවාරි 01 දිනට ශේෂය | 1,171,875 | 1,897,936 | (1,465) | (1,886) | (191,131) | - | 2,875,329 |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | - | 725,665 | - | - | - | - | 725,665 |
| වර්ෂය සඳහා වූ ලාභය | | | | | | | |
| **වර්ෂය සඳහා වූ වෙනත් විස්තීරණ ආදායම්,(බදු පසු)** | - | - | 433,283 | - | - | - | 433,283 |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | | | | | | | |
| - ජීවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා | - | - | (414,403) | - | - | - | (414,403) |
| වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | (7,998) | - | - | (7,998) |
| - ප්‍රතිමිනුම් මත අලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | - | - | 18,880 | (7,998) | - | - | 10,882 |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම** | - | 725,665 | 18,880 | (7,998) | - | - | 736,547 |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | | | | | | | |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ සංචිත අරමුදලට පවරන ලද විකිණීම සඳහා | | | | | | | |
| වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | 414,403 | - | 414,403 |
| **හිමිකරුවන් සමග සිදුවූ, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | | |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | | |
| 2016 වර්ෂය සඳහා වූ ලාභාංශ ගෙවීම් | - | (250,000) | - | - | 414,403 | - | (250,000) |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,171,875 | 2,373,601 | 17,415 | (9,884) | 223,272 | - | 3,776,279 |
| **2018 ජනවාරි 01 දිනට ශේෂය** | 1,171,875 | 2,373,601 | 17,415 | (9,884) | 223,272 | - | 3,776,279 |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | | | | | | | |
| වර්ෂය සඳහා වූ ලාභය | - | 2,094,059 | - | - | - | 381,156 | 2,475,215 |
| **වෙනත් විස්තීරණ ආදායම්,(බදු පසු)** | | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (441,103) | - | - | - | (441,103) |
| - ජීවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා | | | | | | | |
| වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 425,139 | - | - | - | 425,139 |
| - ප්‍රතිමිනුම් මත ලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | - | - | - | 5,489 | - | - | 5,489 |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම** | - | - | (15,964) | 5,489 | - | - | (10,475) |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | 2,094,059 | (15,964) | 5,489 | - | 381,156 | 2,464,740 |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා | | | | | | | |
| වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | (425,139) | - | (425,139) |
| **හිමිකරුවන් සමග සිදුවූ, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | | |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | | |
| 2017 වර්ෂය සඳහා වූ ලාභාංශ ගෙවීම් | - | (300,000) | - | - | - | - | (300,000) |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,171,875 | 4,167,660 | 1,451 | (4,395) | (201,867) | 381,156 | 5,515,880 |

ඉහත හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමාගම, වාර්ෂික වාර්තාවේ පිටු අංක 221 හී ඇති විගණනය කරන ලද හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 න් අවසන් වු වර්ෂය සඳහා, | | සමූහය 2018 | සමූහය 2017 | සමාගම 2018 | සමාගම 2017 |
|---|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| බදු පෙර ලාභය | | 1,580,654 | 927,027 | 1,297,848 | 725,665 |
| ගැලපීම්: | | | | | |
| පොළී ආදායම | | (1,883,053) | (1,684,689) | (1,588,206) | (1,435,151) |
| ලාභාංශ ආදායම | | (4,290) | (8,502) | (3,694) | (6,922) |
| අස්පෘෂ්‍ය වත්කම් ක්‍රමාක්ෂය | | 19,685 | 18,937 | 19,540 | 18,937 |
| දේපල පිරියත හා උපකරණ ක්ෂය | | 49,285 | 51,770 | 34,533 | 36,142 |
| සේවක ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම් | | 33,928 | 30,540 | 20,023 | 18,028 |
| උපලබ්ධි වූ ශුද්ධ ලාභ | | (74,058) | (33,128) | (68,673) | (28,789) |
| ශුද්ධ සාධාරණ අගය මත (ලාභ)/අලාභ | | (8,482) | (9,704) | 18,036 | (7,653) |
| දේපල පිරියත හා උපකරණ විකුණුම් ලාභ | | (178) | (5,584) | (171) | (5,934) |
| | | (286,509) | (713,333) | (270,764) | (685,677) |
| මෙහෙයුම් වත්කම් වල ශුද්ධ වෙනස | (අ) | 132,856 | (548,793) | (5,350) | (241,501) |
| මෙහෙයුම් වගකීම් වල ශුද්ධ වෙනස | (ආ) | 1,706,125 | 2,796,294 | 1,498,548 | 2,262,645 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ | | 1,552,472 | 1,534,168 | 1,222,434 | 1,335,467 |
| ගෙවූ පාරිතෝෂිකය | | (13,301) | (7,440) | (4,618) | (3,397) |
| ආර්ථික සේවා ගාස්තු | | (20,120) | (16,919) | - | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ | | 1,519,051 | 1,509,809 | 1,217,816 | 1,332,070 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| ආයෝජන සුරැකුම් ශුද්ධ මිලදී ගැනුම් | | (2,900,729) | (2,767,527) | (2,331,810) | (2,425,152) |
| ලද පොළී | | 1,869,967 | 1,443,722 | 1,590,860 | 1,231,609 |
| ලද ලාභාංශ | | 4,493 | 9,100 | 3,760 | 7,483 |
| අස්පෘෂ්‍ය වත්කම් මිලදී ගැනුම් | | (22,931) | (15,896) | (20,481) | (15,896) |
| දේපල පිරියත හා උපකරණ මිලදී ගැනුම් | | (34,459) | (64,943) | (22,113) | (46,196) |
| දේපල පිරියත හා උපකරණ විකුණුම් සඳහා ලද මුදල් | | 3,413 | 10,498 | 2,342 | 9,061 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යොදා ගත් ශුද්ධ මුදල් ප්‍රවාහ** | | (1,080,246) | (1,385,046) | (777,442) | (1,239,091) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| ලාභාංශ ගෙවීම් | | (300,000) | (250,000) | (300,000) | (250,000) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යොදා ගත් ශුද්ධ මුදල් ප්‍රවාහ** | | (300,000) | (250,000) | (300,000) | (250,000) |
| **මුදල් සහ මුදල් වලට සමාන වත්කම් වල ශුද්ධ (අඩුවීම)/වැඩිවීම** | | 138,805 | (125,237) | 140,374 | (157,021) |
| වසර මුල මුදල් සහ මුදල් වලට සමාන වත්කම් | | 500,290 | 625,527 | 319,551 | 476,572 |
| **වසර අවසානයේ මුදල් සහ මුදල් වලට සමාන වත්කම්** | | 639,095 | 500,290 | 459,925 | 319,551 |

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ සටහන්**

| | සමූහය 2018 | සමූහය 2017 | සමාගම 2018 | සමාගම 2017 |
|---|---|---|---|---|
| **(අ) මෙහෙයුම් වත්කම් වල වෙනස** | | | | |
| විලම්භිත වියදම් වල වැඩි වීම් | (35,199) | (30,336) | - | - |
| ජීවිත රක්ෂණ හිමියන්ට දී ඇති ණය වල වැඩි වීම් | (80,828) | (41,844) | (80,828) | (41,844) |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වල අඩුවීම්/(වැඩිවීම්) | 154,005 | (75,052) | (10,916) | (10,196) |
| ලැබිය යුතු රක්ෂණ වාරිකයන්හී වැඩිවීම් | (11,894) | (163,025) | (558) | (683) |
| මුළු වෙනත් වත්කම් වල අඩුවීම්/(වැඩිවීම්) | 106,772 | (238,536) | 86,952 | (188,778) |
| **මෙහෙයුම් වත්කම් වල ශුද්ධ වෙනස** | 132,856 | (548,793) | (5,350) | (241,501) |
| **(ආ) මෙහෙයුම් වගකීම් වල වෙනස** | | | | |
| අනෙකුත් වගකීම් වල වැඩි වීම් | 188,803 | 99,806 | 112,608 | 43,388 |
| රක්ෂණ ප්‍රතිපාදන – ජීවිත රක්ෂණ වල වැඩි වීම් - බදු පෙර | 1,360,322 | 2,168,002 | 1,360,322 | 2,168,002 |
| රක්ෂණ ප්‍රතිපාදන – සාමාන්‍ය රක්ෂණ වල වැඩි වීම් | 140,189 | 463,339 | - | - |
| ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ – වැඩි වීම් | 16,811 | 65,147 | 25,618 | 51,255 |
| **මෙහෙයුම් වගකීම් වල ශුද්ධ වෙනස** | 1,706,125 | 2,796,294 | 1,498,548 | 2,262,645 |

ඉහත මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 222 හී ඇති විගණනය කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.